හරස්කඩ

රිටිපන්න ධීවර සංස්කෘතිය

සහන් හේවාගමගේ
madusankasahan@gmail.com

ලාංකේය ජන ජීවිතය විෂයෙහිලා විෂය ගතවූ විවිධ වූ වෘත්තීන් පවතී. මෙම වෘත්තීන් අතර ධීවර වෘත්තිය වඩාත් කැපී පෙනෙන අතර, කෘෂිකර්මාන්තය තරම්ම මෙය මෙරට ජන ජීවිතයට බද්ධව පවතී. මෙම ධීවර වෘතිය අනාදිමත් කාලයක සිට මෙරට වෙරළබඩ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වන අතර එය පරිභෝජන රටාව විෂයෙහිලා ද සිදු කරනුයේ මහත් වූ බලපෑමකි. මේ සාකච්ඡාවට ලක් කරනුයේ ලක්දිව ධීවර වෘත්තියට වඩාත් සුවිශේෂී වූ ක්‍රම රටාවක් පිළිබඳවයි.

ලක්දිව දකුණු පළාතේ, මිදිගම, අහංගම සහ වැලිගමට පමණක් ආවේණික වූ රිටිපන්න ධීවර වෘත්තිය වඩාත් සුවිශේෂී මෙන්ම සංස්කෘතික අංගෝපාංගවලින් ගහණ වූවකි. මෙම රිටි පන්න ධීවර වෘත්තිය පිළිබඳ සාක්ෂි සහගත ලේඛනගත තොරතුරු නොමැති තරම්ය. නමුදු ජනශ්‍රැතික සාධක විෂයෙහිලා ගත්කල මෙම රිටිපන්න ධීවර වෘත්තිය මීට වසර 300 කට එහා දිව යන්නකි. එනම් ලන්දේසි යුගය මෙහි මූලාරම්භයයි.

මෙම රිටිපන්න වෘත්තියට වඩාත් සුදුසු පරිසරය වන්නේ තරමක කැලඹිලි සහගත නොවන මුහුදු තිරයයි. වෙරළ තිරයට වඩාත් ළංවූ මෙම මුහුදු තිරය ගල්පරවලින් ගහන පරිසරයක් බැවින් බෝට්ටු ගමන් කිරීම දුෂ්කර මෙන්ම අවදානම් සහගත වෙයි. ඒ නිසා මෙම රිටිපන්න ධීවර වෘත්තිකයන්ගේ වෘත්තියට සෙසු බාධාවක් නොමැත. මෙම රිටිපන්න ධීවර වෘත්තිය මෙසේ හැඳින්වීමට මූලික කාර්යය වන්නේ රිටක් මත වාඩිවී මසුන් ඇල්ලීමෙහි නිරත වීමයි. මෙම රිට ඉතා සවි ශක්තියකින් හෙබිය. එසේම එම රිට ඉහළ කෙළවර ආරුක්කුවක් හැඩැති වීම වඩාත් පහසු වන අතර නැතිනම් එම රිට සිටු වීමට පෙර එවැනි ආරුක්කුවක් සවි කරනු ලැබේ. අතීතයේ නම් මෙසේ බඳිනු ලබන්නේ සවි ශක්තියෙන් හෙබි වැල් පොටක ආධාරයෙනි. (නූතනයේ කම්බි සහ නයිලෝන් නූල් මීට යොදා ගනී.) මෙම ආරුක්කුව පුද්ගලයෙකුට වාඩිවී සිටිය හැකි පරිදි ශක්ති සම්පන්න විය යුතු අතර එම ආරුක්කුවේ අගට කෙළවරසිට නැවත ලී දණ්ඩක ප්‍රධාන රිටට සම්බන්ධ කරයි. එයින් වාඩි වී සිටින ධීවරයාට වඩාත් පහසු වන අතර සිය දෙපා නවා ගැනීමට සහ සමබරතාව රැක ගැනීමට මහෝපාකරී වේ. මෙම ආරුක්කු සහ ලී දඬු සම්බන්ධ කරන විට, වඩාත් සුවිශේෂී වනුයේ මෙහි ප්‍රධාන රිටට සම්බන්ධ වන කෙළවර පිටට මතුවන ලෙස පිහිටුවා සිටි කිරීමයි. මෙම ලී දඬු බොහෝ විට කුරුඳු වැනි සවි ශක්ති ලී මඟින් නිර්මාණය වන අතර ප්‍රධාන රිට ගැඹුරට ගිල්ලවයි. එය ඉතා අපහසු කටයුත්තක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. කිහිප දෙදෙනෙකුගේ අධාර උපකාර මත මෙම රිට මුහුදු ජලය සහිත, වැල්ලේ ගිල්වනු ලබන අතර හෝරා කිහිපයක් මේ සඳහා වැය කිරීමට සිදු වෙයි.

මෙම රිටි පන්න ධීවර වෘත්තිය එක්තරා පරම්පරාවකට පමණක් ආවේණික හා එම පරම්පරාවට පමණක් සීමා සහිත වූ ඉඩ කඩ ප්‍රදේශයක සිදු වෙයි අලුත් රිටක් සවි කිරීමට සහ රිටට නැඟීමට හැකියාව පවතිනුයේ එම පරම්පරාවේ අයෙකුට පමණි. ඔවුනොවුන් විසින් තම පවුල්වලට සීමා සහිත වූ මුහුදු ප්‍රදේශ වෙන් කොට තබා ගනී. එසේම තම වෙරළ සීමාව තුල පදිංචි පවුල්වල පිරිස් සඳහා පමණක් මේ අවස්ථාව හිමිවන අතර පිට ගමකින් පැමිණෙන අයෙකුට සහ ධීවර වෘත්තියේ නිරත නොවන පිරිස් සඳහා මෙම රිටට නැඟීම තහනම්ය. මෙම රිටි සහිත ධීවර වෘත්තියේ නියැලෙන සහ නියැලුණු වැඩි මහළු ප්‍රවීණයෙකු රිටකට පැමිණෙන්නේ නම් ඔහුට ඉඩ දී අනෙක් පුද්ගලයා බැස යා යුතු බව සම්ප්‍රදානුකූලව ගොඩ නැගී ඇති චාරිත්‍රයයි. එසේම මේ රිටි පන්න ධීවරයන් සතුව ඔවුනොවුන්ට ම වෙන් වූ බිලී පිති පවතින අතර මේවා සකසා ගනුයේ කිතුල් පිති ආධාරයෙනි. අලුත් කිතුල් පිති, තද අව්වේ වේලා රත්කොට යම් කිසි බරක් යොදා එහි වක් ස්වරූපය කෙලින් කර ගනී. පසුව සති 02 ක් පමණ දුමේ දමා වේලා ගන්නා අතර අදාළ ප්‍රමාණයට කපා කොටා සකසා ගනී. මෙම පිති අග කෙළවර තරමක් නම්‍යශීලි ස්වභවයෙන් පැවතීම නිසා මසුන් ඇල්ලීමේ කටයුත්ත වඩාත් පහසු කරනු ඇත. සාමාන්‍ය වශයෙන් පිත්තක දිග අඩි 05-06 ක් අතර ප්‍රමාණයකි.

මෙම මසුන් ඇල්ලීම සඳහා පිත්ත අගට ගැට ගසනු ලබන තංගුස් නුහුල් පට සඳහා අතීතයේ භාවිතා කොට ඇත්තේ අන්නාසි කෙන්දකි. එය ඒ තරමට ම ඉතා සියුම් සුළු චලනයකටත් සංවේදී වන නුහුල් පොටකි. මෙම නුහුල්පොට කෙළවර සවි කරනු ලබන බිලී කටුව ඉතා සුවිශේෂී වූවකි. එය සකසා ගැනීම ඔවුනොවුන්ගේ නිවසේදීම සිදු කරනු බලන අතර, ඒ සඳහා සුවිශේෂී වූ ක්‍රම රටාවක් පවතී. මෙම බිලී කටු ඊයම් බිලි ලෙස හඳුන්වයි. සුදු ඊයම් සහ කළු ඊයම් යනුවෙන් බිලී කටු දෙවර්ගයක් වන අතර සුදු ඊයම් බිලි ජනප්‍රිය වේ. මෙම බිලි කටු සකසා ගැනීම සඳහා, පොතු දැල්ලාගෙ දැලි පොත්ත උපයෝගි කර ගනී. එම දැල්ලන් විශේෂය සාමාන්‍ය දැල්ලන්ට වඩා විශාල අතර උන්ගේ පිට පොත්ත ශක්තිමත්ය. එවැනි පොතු 02 ක් මේ සඳහා උපයෝගි කරගනී. හොඳින් වේලාගත් එම පොත්ත ඇතුළත සමතලා කර ගැනීම පළමුව සිදු වේ. බිලි කටු සැකසීමට සුදු යකඩ වැල් (කම්බි) යොදා ගන්නා අතර එය ඉතා සිහින් කම්බි විශේෂයකි. ඉන් අඟල් 1 1/2 ක පමණ දිගින් යුතු කැබලි කිහිපයක් කපා වෙන් කර ගනී. (සාමාන්‍යයෙන් මෙම දැලි පොත්ත මත අනුපිළිවෙලට තැබිය හැක්කේ, එවැනි කුඩා කම්බි කැබලි 6-8 ක් ප්‍රමාණය වේ.) පසුව දැලි පොත්ත ඇතුළට හරස් අතට එම කැබලි තබා එය පියනක් ලෙස ඉහළින් ද ආවරණ කොට එක් කෙළවරකින් ඊයම් උණු කොට වැක්කිරීම සිදු කරයි. විනාඩි 10 - 15 කට පසු එසේ එකිනෙක සම්බන්ධ කළ දැලි පොත්ත වෙන් කරන අතර ඊයම ගැල්වූ කම්බි වැලක් දැකිය හැක. පසුව කම්බි කැබලි වටේ ගැල්වී තිබෙන ඊයම් දිය බිංදුවක හැඩයට සකසා ගැනීම තම දක්ෂතාවය මත සිය දෑතින්ම සිදු කර ගනී. එසේ දිය බිංදුවක හැඩයට සකසා ගැනීමේ මූලිකම අරමුණ මෙම බිලි කටුව ජලයට ඇමූ විට ජලය තුළට කිඳා බැසීමට දක්වන ප්‍රවණතාව වඩාත් වර්ධනය කිරීමටයි. පසුව එසේ බර වැඩි පාර්ශ්වයේ ඇති කටුව කොක්කක් හැඩට නවා ගැනීම සිදු වෙයි. අනෙක් පස නූල ගැට ගැසිය හැකි

බිලී කටු සැකසීම



පොතු දැල්ලාගේ දැලි පොත්ත

ආකාරයට සකසා ගනී. මෙම ක්‍රමවේදය නිවසේදීම සිදු කරගනු ලබන අතර වෙළඳපොළෙන් මෙවැනි හැඩති බිලි කටු මිලදී ගැනීමට නොහැක.

උදෑසන 6.00 ට පෙර රිටට ගොඩ වෙන ධීවරයන්, 09 වන තෙක් මසුන් ඇල්ලීමෙහි නිරතවන අතර, නැවත ගොඩ බිමට විත් උදෑසන ආහාර වේලෙන් පසුව, නැවත රිටට ගොඩවෙයි. නැවතත් දහවල් ආහාරය පිණිස දහවල් 02 ට පමණ පැමිණෙන අතර නැවතත් සවස 05 පමණ වනතෙක් මසුන් ඇල්ලීමෙහි නිතර වෙයි. දහවල් කාලයේ මසුන් සුලභ බැවින් සවස් යාමේ මසුන් නැවතත් දියට ඇදෙයි. මෙම රිටි පන්න ධීවර කටයුතුවල යෙදෙන මුහුදු ආශ්‍රිතව දැල් මඟින් මාළු බෑමට අවසර නොමැත. සිදු කළ හැක්කේ රිටිපන්න ධීවර කටයුතුවල පමණි. අතීතයේ මෙම මසුන් මරන්නන් සිය පන්කොල මල්ලත් රැගෙන රිටට ගොඩ වෙන අතර එය සිය ආරුක්කුවේ පසෙක එල්ලා තබයි. එමෙන්ම බිලි කොකු 10 ක් 15 ක ප්‍රමාණයක් රැගෙන යාමටද අමතක නොකරයි. වඩා වැඩි බරකින් හෙබි මසුන් ඇල්ලිම මෙහිදී අපහසු වන අතර සාමාන්‍ය ප්‍රමාණයේ මසුන් පමණක් සීමා වෙයි. දිනකට මසුන් 100 ක් 150 ක් පමණ මෙම ධීවරයන්ට හසුවන අතර මෙම සියලුම ක්‍රියාකාරකම් සිදුවනුයේ වාරකන් කාල සීමාව තුළ පමණි. එනම් ගැඹුරු දියඹ කැලඹෙන කාලසීමාව තුළ මසුන් වඩාත් ගොඩ බිමට ආසන්න වන්නට සිය වාසස්ථාන සකසා ගනී. මාස 06 ක කාල සීමාවක් පමණක් තුළ සිදුවන මෙම ක්‍රියාවලිය නිසා රිටිපන්න ධීවරයන්ට පමණක් නොව සෙසු ධීවරයන්ටද සිය වෘත්තියේ නියැලීම කාර්ය බහුලවේ.

මෙම රිටිපන්නයේ ධීවර වෘත්තිය ඉතා අපහසු ඒකාකාර වෘත්තියකි. තනි රිටක රැදෙමින්, එකම ඉරියව්වක සිට, ඉවසිමෙන් ප්‍රගුණ කළ යුතු මෙම වෘත්තිය අත්දැකිමක් සමඟ ලබන ප්‍රවීණත්වය මත රඳා පවති. දිගු වේලාවක් මෙසේ එක්තැන රැඳී සිටිමින් මසුන් ඇල්ලීම මාස 03 ක් 04 ක් යන තුරු පුරුදු පුහුණු විය යුතුය. සම්බරතාවය, සංවේදිතාව ඉතා වැදගත් කොට සැලකිය හැක.

ලංකාවේ දකුණු බඩ මුහුදු වෙරළෙහි වැලිගම, අහංගම, මිදිගමට පමණක් ආවේණික මෙම රිටිපන්න ධීවර වෘත්තිය සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට සමත්වූ සංස්කෘතිකමය වෘත්තියකි. අනාදිමත් කාලයක පටන් ධීවර වෘත්තිය ලාංකිය ජන ජීවිතය තුළට කිඳා ඇත. එමගින් උණ පූර්ණය ලද මෙම රිටි පන්න ධීවර කලාව ධීවර ජනතාවගේ සංස්කෘතියට අනන්‍යවූ ආවේණික වූ වෘත්තියකි. පුරා දවසක් තනි රිටකට වී මසුන් ඇල්ලීම ඇතැම් විට හාස්‍ය සහ මවිතය දනවන කරුණක් වුවද, මිනිසුන්ගේ වෘත්තීන් ඔවුනොවුන්ට ආවේණික හැඩතල මත ගොඩ නැගී ඇති බවට මෙය මනාවූ සාක්ෂියකි. දකුණු ලක වෙරළ බඩ සුන්දරත්වයේ අපූර්වත්වය රිටි පන්න ධීවර කලාව සමගින් ආභරණයක් බවට පත්ව ඇත. එදා සිට අද දක්වා මෙම වෘත්තියේ නිරතවන ධීවර ජනතාවගේ මෙකී ජීවන රටාව සංස්කෘතික ඇගයීමට ලක්විය යුතු බව මාගේ විශ්වාසයයි.